THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 2 - Issue I
October-November 2024

T J O L C
ISSN 2806-5395

Category: Research Article

# සිංහල භාෂාවේ අර්ථ විපර්යාසය පිළිබඳ තුලනාත්මක වාග් විද්‍යාත්මක අධ්‍යයනයක් (සිඛවලඳ ඇසුරෙන්)

ගල්කුලමේ උපරතන හිමි

ARTICLE DETAILS

Published Online & Printed
October-November 2024

*Author:*

**Rev. Galkulame Uparathana Thero**
***Senior Lecturer***
Department of Languages
Rajarata University of Sri Lanka
Email: *upa071@gmail.com*

**J.A. Mahesh Rohan Jyawardhana**
***Teacher***
Sinhala Buddhist College
Matale
Email: *academicmahesh6@gmail.com*

***Keywords***:
Comparative Linguistics, Semantic Change, Sikhawalanda, Sinhala Language

## Abstract

This study explores semantic change in the Sinhala language through a comparative linguistic lens, with a focus on words from Sikhawalanda, a holy text written in Sinhala. Semantic analysis, a fundamental method in understanding linguistic meaning, is used to trace the historical evolution of word meanings within this text. Building upon foundational theories by Michael Brielle, Leonard Bloomfield, Stephen Ullman, and Ferdinand de Saussure, the research investigates how regional and social dialects, psychological influences, and socio-cultural factors contribute to shifts in meaning. The study particularly draws on the frameworks of meaning change methods outlined by Ananda Jayasekara and Chitra Jayasekara, examining both semantic opposition and loss, as well as the processes of semantic change in Eastern languages. Through a qualitative methodology, this research analyzes Sinhala dictionaries and Sikhawalanda as primary sources, highlighting how many words from ancient Sinhala (Numusu Hela) have evolved in their meanings in modern usage.

## හැඳින්වීම

භාෂාව යනු සන්නිවේදන මාධ්‍යයකි. මිනිසා විසින් නිපදවන ලද වඩා වැදගත් උපකරණය වන භාෂාව ක්‍රමවත් ලෙස පිළියෙල වූ ශබ්ද සංකේත පද්ධතියකි. විවිධ භාෂක සමාජයන්හි එකම වස්තුව හැඳින්වීම උදෙසා භාවිත කරන වචන විවිධ වේ. එනයින් භාෂාව ආරෝපිත අර්ථවත් සංකේත පද්ධතියක් ලෙස හැඳින්විය හැකි ය. නිදසුනක් ලෙස 'පුටුව' යන වචනය විශ්ලේෂණය කළ හැක. කකුල් හතරක් සහිත අයෙකු ඉඳගැනීමට භාවිත කරන උපකරණය සිංහල භාෂාවේ එනමින් හැඳින්වෙයි. එය ම පාලි භාෂාවේ 'පීඨං' ලෙස ද හින්දි භාෂාවෙහි 'කුර්සි' ලෙස ද දෙමළ භාෂාවෙන් 'කදිරෛ' ලෙස ද හැඳින්වෙයි. සමස්ත මානව සමාජය බැඳ තබන භාෂාව සමාජ පරිණාමයත් සමග විවිධ අංශ ඔස්සේ සංවර්ධනය විය. ඒ අනුව භාෂාවේ සම්භවය, භාෂාවේ කාර්ය පිළිබඳ අධ්‍යයනය කිරීම ආරම්භ වූ අතර අනුක්‍රමයෙන් එය වාග්විද්‍යාත්මක අධ්‍යයනය දක්වා සංවර්ධනය විය.

වාග්විද්‍යාවේ ආරම්භය සංස්කෘත ව්‍යාකරණයෙහි වාක්‍ය විග්‍රහ කිරීමත් සමග සිදු විය. **පාණිනී**, **හේමචන්ද්‍ර**, **කාත්‍යායන**, **පතංජලී** වැනි ආරම්භක පෙරදිග භාෂාවේදීහු ද **පයිතගරස්**, **හෙරක්ලයිටෝස්**, **ප්ලේටෝ**, **ඇරිස්ටෝටල්**, **දියෝනිසියස් ත්‍රැක්ස්**, **ඇපලොනියස්**, **වරෝ**, **ලොරෙන්ටියස්** වැනි අපරදිග භාෂාවේදීහු ද වාග්විද්‍යා අධ්‍යයනයට අදාළ පදනම සකස් කළහ. පසුකාලීන ව විග්‍රහාත්මක වාග්විද්‍යාව, ඓතිහාසික වාග්විද්‍යාව, තුලනාත්මක වාග්විද්‍යාව, සමාජීය වාග්විද්‍යාව ආදි අංශ ඔස්සේ වාග්විද්‍යා අධ්‍යයනය සංවර්ධනය විය. මෙම අධ්‍යයනය තුලනාත්මක වාග්විද්‍යාවේ සාකච්ඡා කෙරෙන අර්ථ විපර්යාසය (semantic change) නම් වාග්විද්‍යා අංශය පිළිබඳ සිදුකෙරෙන්නකි.

භාෂා පරිණාමයට අනුව වචනවල අදහස් නන් අයුරින් වෙනස් වන සැටි හා ඊට හේතූන් උගන්වන වාග්විද්‍යා අංශය අර්ථ විපර්යාසය යි(ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර, 2015). අර්ථ විපර්යාසය භාෂා අධ්‍යයනයේ ප්‍රධාන අංශයක් ලෙස පර්යේෂණයට ලක් වී ඇත්තේ දහනම වන සියවසේ අග භාගයේ දී ය. අර්ථ විපර්යාසය පිළිබඳ මුල් ම කෘතිය '**එසේ දේ සෙමැන්ටික්**' (Essai de semantique by Breal 1897) නම් බ්‍රියෙල් (Breal) රචනා කළ කෘතිය යි (Breal, 1897). නූතන වාග්විද්‍යාවේ පියා ලෙස සැලකෙන **ෆර්දිනන්ද් දි සොසුය්යෝ** (Ferdinand de Saussure) විසින් පවත්වන ලද දේශනා ඇසුරින් රචිත **Course foa Linguistique Generale** නම් කෘතියේ ද භාෂා අර්ථය වෙනම අධ්‍යයනය කිරීම පිළිබඳ ව සඳහන් කර ඇත(ගමගේ, 2017).

සරල ව අර්ථ විපර්යාසය ලෙස සැලකෙන්නේ ඕනෑම භාෂාවක අතීතයේ පැවති වචනයක් භාෂා පරිණාමයත් සමග ක්‍රමයෙන් අර්ථය යම් වෙනසකට භාජනය වීම යි. වචනයක අර්ථ විපර්යාසය සිදුවීමට සංස්කෘතික සංස්පර්ශය ප්‍රධාන හේතුවක් වෙයි. නිදසුනක් ලෙස සිංහල භාෂාව පෙන්විය හැක. සමාජ, දේශපාලන, ආර්ථික සාධක හේතුවෙන් ඉන්දීය, පෘතුගාල, ඕලන්ද හා එංගලන්ත සංස්කෘතිය සමග ලාංකේය සංස්කෘතිය මැනවින් ස්පර්ශ වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සිංහල භාෂාව පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි, අරාබි, පාලි,

සංස්කෘත වැනි භාෂා සමග සංස්පර්ශය විය. එහෙයින් සිංහල භාෂාව අනුරාධපුර අවධියේ සිට අද දක්වා ම ක්‍රමයෙන් සංවර්ධනය වූ අතර වචනවල අර්ථ ද වෙනසට භාජනය වූ බව පෙනෙයි.

ක්‍රිස්තු පූර්ව අවධියේ දී ලංකාවට අනන්‍ය වූ භාෂාවක් පැවති බව ඓතිහාසික මූලාශ්‍රයවලින් විශද වෙයි. එකී අවධියේ භාවිත භාෂාව අමිශ්‍ර වූ ශුද්ධ සිංහල භාෂාව යි. ඉන්දීය ආක්‍රමණවලට පෙර ලක්දිව පැවති නුමුසු හෙළ බසෙහි ස්වභාවය අධ්‍යයනය කිරීමට ශේෂ ව ඇති අල්ප කෘති සමූහය අතර සිඛවලඳ හා සිඛවලඳ විනිසට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. පාලි ප්‍රාතිමෝක්ෂය මූලාශ්‍රය කරගනිමින් රචිත සිඛවලදෙහි අරමුණ වී ඇත්තේ උපසපන් භික්ෂුව විසින් පිළිපැදිය යුතු ශාසනයේ විනය නීති හෙළ බසින් රචනා කිරීමයි. පාලි ප්‍රාතිමොක්ෂයේ සඳහන් දෙසිය විස්සක් වූ විනය නීති අතුරෙන් ලක්දිව භික්ෂූන් වහන්සේට උචිත විනය නීති ඉදිරිපත් කරමින් රචිත මෙය හුදෙක් උපසපන් භික්ෂුවගේ අත්පොතක් ලෙස සැලකීම සාවද්‍ය නොවේ. සිඛවළදෙහි පාරාජිකා සතරක්, සංඝාදිසේස හතක්, නිස්සග්ගිය දහහතරක්, පාචිත්තිය හතළිස් එකක්, පකිණ්ණක හැට එකක් හා පොහෝ පවුරුණු පහක් ද අන්තර්ගත වෙයි.

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ සිඛවලඳ හා සිඛවලඳ විනිස යි. දත්ත සීමාව වන්නේ සිඛවලඳ යි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ සිදු කෙරෙන අතර නූතන වාග්විද්‍යාත්මක අර්ථ විපර්යාස ලක්ෂණ සිඛවලදෙහි අන්තර්ගත ව ඇත් ද යන්න පර්යේෂණ ගැටලුව වශයෙන් තබා ගෙන මෙම පර්යේෂණය සිදු කෙරේ. සාහිත්‍ය විමර්ශනයේ දී සිංහල වචනවල අර්ථ විපර්යාසය සිඛවලඳ පමණක් ඇසුරු කොටගෙන ගැඹුරින් සාකච්ඡා කරන ලද පූර්ව අධ්‍යයන සොයා ගැනීමට නොහැකි වීම මෙම අධ්‍යයනයේ නිරත වීමට හේතු විය. අනුරාධපුර රාජධානි සමයේ විදේශ ආධිපත්‍යයට පෙර පැවති සිංහල භාෂාවේ ස්වභාවය හා එහි සංවර්ධිත බව හඳුනාගැනීමත්, වර්තමානයේ එම වචනවල භාවිතය හඳුනාගැනීමත් මෙන් ම ව්‍යවහාර සිංහලයේ එම වචන අර්ථ විපර්යාසයට ලක් වී ඇති ආකාරයත් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණු වෙයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මේ පර්යේෂණ කාර්ය සඳහා න්‍යායික සීමාව වූයේ තුලනාත්මක වාග්විද්‍යාවේ ප්‍රධාන අංශයක් ලෙස සැලකෙන අර්ථ විචාරය (semantics) යි. දත්ත සීමාව සිඛවලඳ යි. සිඛවලඳ හි තෝරාගත් වචන කිහිපයක් පමණක් අර්ථ විපර්යාස ක්‍රම විග්‍රහ කිරීම සඳහා භාවිත කර තිබේ. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි විසින් සංස්කරණය කර ඇති සිඛවලඳ හා සිඛවලඳ විනිස පරිශීලනයෙන් හඳුනාගත් අර්ථ විපර්යාසයට ලක් වූ වචන අර්ථ විපර්යාස ක්‍රම හත යටතේ විග්‍රහ කර රැස් කර ගත් දත්ත ගුණාත්මක විශ්ලේෂණය ඔස්සේ විශ්ලේෂණයට භාජනය කොට ඇත.

## සාකච්ඡාව

අර්ථ විපර්යාසය (semantic change) තුලනාත්මක වාග්විද්‍යාවේ වැදගත් අංශයක් ලෙස නූතනයේ අධ්‍යයනයට ලක් කෙරෙයි. අර්ථ විපර්යාසය සිදු වන්නේ අර්ථ පාරිණාමය වීමෙනි. ප්‍රස්තුත භාෂා රූපගත හෝ නිරූපණ පරිණාමයක් සහිත ව හෝ රහිත ව හෝ භාෂාවෙහි එක්තරා අවස්ථාවක දී යෙදෙන අර්ථය තවත් අවස්ථාවක දී වෙනස්වීමකට ලක්වීම අර්ථ පරිණාමය ලෙස හැඳින්වේ(කරුණාතිලක, 2006). අපරදිග ව්‍යාකරණයේ පියා ලෙස සැලකෙන **ඇරිස්ටෝටල්** යම් ආකාරයක අර්ථ විපර්යාස ක්‍රම පිලිබඳ වර්ගීකරණයක් කර ඇති අතර එය භාෂා අධ්‍යයනයේ ප්‍රධාන අංශයක් වශයෙන් දියුණු කොට අධ්‍යයනය කිරීම ආරම්භ කළේ **ì%fh;** නම් වාග්විද්‍යාඥයා ය(ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර, 2015). **ඇරිස්ටෝටල්** වචනයේ අර්ථය උපයෝගී කරගෙන වර්ග දහයකට වෙන් කොට තිබේ. ඒවා නම්, ද්‍රව්‍ය (substance), ප්‍රමාණය (quantity), ගුණය (quality), සම්බන්ධය හෙවත් ඥාතිත්වය (relation), ස්ථාන (place), වේලාව (time), පිහිටීම (position), තත්ත්වය (state), ක්‍රියා (action) හා හැඟීම් (affection) යන්න යි (Modrak, 2000).

වර්ෂ 1832 මාර්තු 26 වන දින ප්‍රංශයේ උපත ලද **මයිකල් ජූල්ස් ඇල්ෆ්‍රඩ් බ්‍රියෙල්** (Michel Jules Alfred Breal 1832 - 1915) ප්‍රංශ දාර්ශනිකයෙකි. වර්ෂ 1864 ප්‍රංශයේ **College de France** හි තුලනාත්මක ව්‍යාකරණය පිළිබඳ මහාචාර්යවරයෙකු වූ **ì%fh;** අර්ථ විපර්යාසය යන්නට 'හඟවනවා' යන අර්ථය සහිත ග්‍රීක භාෂාවේ යෙදෙන 'Semaino' යන වචනයෙන් 'semantic' යන වචනය නිර්මාණය කර ඇත. ශබ්ද විද්‍යාව (phonology) හා පද විචාරය (morphology) යන අංශද්වයට පමණක් සීමා වූ වාග්විද්‍යාව බ්‍රියෙල්ගේ නව හඳුන්වාදීමත් සමග අර්ථ විචාරය තුලනාත්මක වාග්විද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයට එක් විය. **ì%fh;** තම විස්තර කිරීම් සමග අර්ථ විපර්යාස ක්‍රම කීපයක් ඇති බව දක්වයි. ඔහු ප්‍රධාන අර්ථ විපර්යාස ක්‍රම හතරක් ද ඊට පරිබාහිර ව සෙසු අර්ථ විපර්යාස ක්‍රම කිහිපයක් ද සඳහන් කරයි. බ්‍රියෙල්ගේ ප්‍රධාන අර්ථ විපර්යාස ක්‍රම හතර නම් **අර්ථ සංකෝචනය හෙවත් විශේෂීකරණය** (Specialization or Narrowing or Restriction of Meaning), **අර්ථ විස්තාරය** (Generalization or Widening or Broadening or Extension of Meaning), **අර්ථාවනතිය** (Pejoration or Deterioration of Meaning), හා **අර්ථෝන්නතිය** (Amelioration or Elevation of Meaning) යි. බ්‍රියෙල් සඳහන් කරන සෙසු අර්ථ විපර්යාස ක්‍රම නම්, අර්ථ පරිවර්තනය (Metaphor), සමාන්තර අර්ථ පරිවර්තනය (Metonymy), ලෝපය (Ellipsi), අර්ථ මෘදුකරණය (Euphemism), අර්ථ තීව්‍ර හා අර්ථ දුර්වල වීම (Intensification & Attenuation or Strengthening and weakening) හා භාවාත්මක ස්වරණය වීම (Shift in Emotional Tone) යි(Breal, 1897).

හංගේරියානු ජාතික **ස්ටෙෆන් උල්මාන්** (1914-1976) ද බ්‍රියෙල්ගේ අදහස අනුව යමින් අර්ථ විපර්යාස ක්‍රම විස්තර කර තිබේ. ඔහු ප්‍රධාන වශයෙන් ම වචනවල අර්ථයේ පරිණාමය පිළිබඳ මූලික අවධානය යොමු කරමින් අර්ථ විපර්යාසය පිළිබඳ සිය මතය ඉදිරිපත්

කර තිබේ. **උල්මාන්** බ්‍රියෙල්ගේ අර්ථ විපර්යාස ක්‍රමවල තිබූ 'අර්ථ තීව්‍ර හා අර්ථ දුර්වල වීම' (Intensification Attenuation or Strengthening and weakening) සහ 'භාවාත්මක ස්වරණය වීම' (Shift in Emotional Tone) යන ක්‍රමවේද වෙනුවට 'අතිශයෝක්තියෙන් පැමිණීම' (Hyperbole) හා 'අර්ථ අවතක්සේරුව' (Litotes) යනුවෙන් වර්ග දෙකක් හඳුන්වා දී තිබේ(Ullmann, 1951). ඒ අනුව මයිකල් බ්‍රියෙල්ගේ මතයම සංවර්ධනය කළ විසි වන සියවසේ කීර්තිමත් වාග් විද්‍යාඥයෙකු ලෙස **ස්ටෙෆන් උල්මාන්** කැපී පෙනෙයි.

ඇමෙරිකානු වාග් විද්‍යාඥයෙකු වන **ලෙනාර්ඩ් බ්ලූම්ෆීල්ඩ්** (Leonard Bloomfield) (1887-1949) ද අර්ථ විපර්යාස ක්‍රම පිළිබඳ අදහස් දක්වා තිබේ. ඔහු ප්‍රධාන වශයෙන් අර්ථ විපර්යාස ක්‍රම පහක් සඳහන් කරයි. එනම් අර්ථ සංකෝචනය (Narrowing), අර්ථ විස්තාරය (Widening), අර්ථාවනතිය (Pejoration), අර්ථෝන්නතිය (Amelioration) හා අර්ථ පරිවර්තනය (Metaphor or Metonymy) ය(Bloomfield, 1933).

භාෂාවක අර්ථ විපර්යාසය සිදු වීමට බලපාන ප්‍රධාන සාධක කිහිපයකි. භාෂා සංස්පර්ශය ඔස්සේ සිදු වන වචන සෘණීකරණය (loan words), භාෂක සමාජයේ භූගෝලීය බෙදීම්, සමාජ-ආර්ථික-දේශපාලනික හේතු, සමාජ සිරිත් විරිත්, මිථ්‍යා විශ්වාස ඉන් කිහිපයකි.

සිංහල භාෂාවේ අර්ථ විපර්යාසය අධ්‍යනය කිරීම සඳහා යොදා ගැනෙන අර්ථ විපර්යාස ක්‍රම හතක් ආනන්ද ජයසේකර හා චිත්‍රා ජයසේකර ඉදිරිපත් කරති. එනම්, අර්ථ විස්තාරය, අර්ථ සංකෝචනය, අර්ථ පරිවර්තනය, අර්ථෝන්නතිය, අර්ථාවනතිය, අර්ථ විරෝධය හා අර්ථ පරිහානිය යන්න යි(ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර, 2015).

## 1. අර්ථ විස්තාරය

ආරම්භයේ දී විශේෂ අදහසක් දීම සඳහා භාවිත වූ වචනයක් පසුව සීමාව ඉක්මවා විශේෂ අදහස් කීපයක් හෝ සාමාන්‍ය පුළුල් අදහසක් හෝ අදහස් කීපයක් දීම සඳහා යෙදේ නම් එය අර්ථ විස්තාරය ලෙස හැඳින් වේ(ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර, 2015). සරලව කිවතොත් අදහස පුළුල් වීමයි. එවැනි වචන කිහිපයක් සිඛවලදෙහි සඳහන් වෙයි.

- ගස් තුරු ලිය ආදී කලකුරුවා නම් පචිති වේ (සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970: 4).

උක්ත පාඨයේ 'ගස්' යන්න අර්ථ විපර්යාසයට ලක් වූවකි. ගස් යන්නෙහි අර්ථය 'කුඩා පැළෑටි' ලෙස සිඛවලදෙහි අරුත් ගැන්වෙයි. කුඩා පැළෑටි, විශාල වෘක්ෂ හා වැල් ආදිය පිළිබඳ තවකෙකුට සිඳීම්, බිඳීම් ආදියෙන් විනාශ කරන්නේ නම් පාචිත්තියට ලක් වන බව මින් අදහස් කෙරේ(සෝරත හිමි, 1999:244). එහෙත් නූතන ව්‍යවහාරයට අනුව සිංහල භාෂාවේ 'ගස්' ලෙස ව්‍යවහාර කරන්නේ ප්‍රමාණයෙන් විශාල වූ වෘක්ෂවලට ය. ඝන වූ කඳක් හා සාමාන්‍යයෙන් අතු පතර ඇති ඉහළට වැවෙන විශාල ශාකය ගස ලෙස සාමාන්‍ය ව්‍යවහාරයේ අරුත් ගැන්වෙයි(විජයතුංග, 2015:661). ගස යන්න බෙංගාලි භාෂාවේ 'ගච්'

(gach) යන්නෙන් සිංහලයට බින්න වූ තත්භව වචනයකි. අඹ ගස, පොල් ගස, තේක්ක ගස ආදියට ගස් යන්න භාවිත කළ ද ප්‍රමාණයෙන් කුඩා වූ ශාකවලට නූතනයේ පැළය යන්න ව්‍යවහාර කරයි.

- **රහමෙර** පරඟලා කෙරේ නම් පවිති වේ(සිබවලඳ හා සිබවලඳ විනිස, 1970 ፡ 5).

පුරාණ අවධියේ රහමෙර ලෙස හැඳින් වී ඇත්තේ 'සුරා හා මෙරය' යන මත්පැන්වලට ය(සෝරත හිමි, 1999:837). 'රහ' යනු සුරාව වන අතර 'මෙරය' යනු පැසවීමෙන් සෑදූ මත් ද්‍රව්‍යයකි(විජයතුංග, 2015:1474). සිබවලඳට අනුව මෙරයට අයත් වී ඇත්තේ රා, අරක්කු ආදි පැසවීමෙන් සාදන ලද දියර මත්ද්‍රව්‍ය යි. සුරාවට අයිති වී ඇත්තේ කංසා, අබින් ආදි දියර නොවන මත්ද්‍රව්‍ය යි. නූතන ව්‍යවහාරයේ සුරා යන්නෙහි අර්ථය විස්තාරයට පත් වී පොදුවේ සියලු දියර මත්ද්‍රව්‍ය හැඳින්වීම සඳහා භාවිත කෙරේ. නිදසුනක් ලෙස විශේෂ දිනවල දී රජය විසින් "අද දින සියලු සුරාසැල් වැසේ." වැනි ප්‍රකාශ ඉදිරිපත් කෙරෙයි. ඉන් ගම්‍යවන්නේ බියර්, අරක්කු, රා ආදි දියර මත්ද්‍රව්‍ය විකුණන ස්ථානවලට ය. ඇතැම් අවස්ථාවල දී නූතන ව්‍යවහාරයේ පොදුවේ සියලු මත්ද්‍රව්‍ය හැඳින්වීම උදෙසා ද සුරා යන වචනය භාවිත කෙරෙයි. නිදසුනක් ලෙස "ඔහු සුරා සූදුවෙන් තොර පුද්ගලයෙකි.", " නිමාලිගේ කොල්ලා සුරා සූදුව පස්සේ යන්නේ නෑ." ආදි ප්‍රකාශ පෙන්වා දිය හැකිය. ඉන් අරුත් ගැන්වෙන්නේ දියර හෝ දියර නොවන කිසිදු මත්ද්‍රව්‍යක් භාවිත නොකරන බව යි. මෙරය යන වචනය නූතනයේ ව්‍යවහාර නොවෙයි. එහෙයින් එහි අර්ථ හානි වී ඇති බවද පසක් වෙයි. කෙසේ නමුත් රහමෙර යන්නෙහි රහ හෙවත් සුරාව අර්ථ විස්තාරයට ලක් වී ඇති ආකාරය හඳුනාගත හැකි ය.

- සැත්කම් **වත්කම්** කරවා නම් තුළැසි වේ.

සිබවලඳට අනුව 'වත්කම්' යනු වස්තුකාමය යි. එහෙත් වත්කම් යන වචනය අර්ථ ගැන්වීමේදී එය 'වත් + කම්' ලෙස ද දැක්විය හැකි ය. වත් යනු වස්තුව යි. කම් යන්නෙහි කාමය අරුත ඇත. සිබවලඳ කතුවරයා වත්කම් ලෙස ඛණ්ඩනය නොකොට එකම වචනයක් ලෙස ලියා ඇත්තේ ශුද්ධ සිංහල වචනද්වයක් වන වත් හා කම් වෙන වෙන ම ලියූ කල්හි අර්ථය වෙනස් වන නිසා විය හැකි ය. නූතන ව්‍යවහාරයෙහි ද වත් හා කම් යන වචන ඒ අරුතින්ම ලේඛනයේ දී භාවිත වෙයි. එහෙත් සිබවලඳෙහි අර්ථය අනුව වස්තුකාමය යන අරුතින් වත්කම් යන්න නූතන සිංහලයේ භාවිත නොවෙයි. තමා සතු දේපළ යන අදහස වත්කම් යන්නෙහි නූතනයේ ගම්‍ය වෙයි. නිදසුනක් ලෙස "වත්කම් බැරකම් ප්‍රකාශනය", "මා සතු සියලු වත්කම් ඔබට භාරයි" ආදි වශයෙන් නූතනයේ වත්කම් යන්න ව්‍යවහාර වෙයි. එහි සරල අදහස නම් තමා සතු දේපළ යි. එහෙත් ධර්මානුකූල දෘෂ්ටිකෝණයෙන් බැලීමේ දී වස්තුකාමය යන වචනය තුළ මම, මාගේය ලෙස අල්ලාගැනීම හෙවත් උපාදානය යන අර්ථය ගැබ් වී ඇත. වස්තුකාමයේ අවසන් ප්‍රතිඵලය දුක යි. එබැවින් වස්තුකාමය යන අදහසින් බෞද්ධාගමික පදනමක සිට සිබවලඳ කතුවරයා වත්කම් යන්න සඳහන් කර

තිබෙන බව ප්‍රත්‍යක්ෂ වෙයි. මෙහි අර්ථ විපර්යාස සිද්ධාන්තය අනුව සලකා බැලීමේ දී අතීතයේ හුදෙක් වස්තු කාමය යන අරුතින් සිඛවලඳ කතුවරයා සඳහන් කර ඇති වත්කම් නූතන ව්‍යවහාරයේ දී අර්ථය පුළුල් වී මිලමුදල්, යානවාහන, වතුපිටි, ගේ දොර, හරක බාන මෙන්ම ව්‍යාපාර ද ඇතුළත් ව තමා සතු සමස්ත දේපළ යන අරුත විශද කරයි.

## 2. අර්ථ සංකෝචනය

මුල දී පුළුල් අදහසක් දීම සඳහා හෝ විශේෂ අදහස් කිහිපයක් දීම සඳහා භාවිත කළ වචනයක් පසුව එක විශේෂ අර්ථයක් දීම සඳහා භාවිත කරන්නේ නම් එය අර්ථ සංකෝචනය වීම හෙවත් අදහස් හැකිළීම ලෙස හැඳින් වේ(ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර, 2015: 100). සිඛවලදෙහි ද අර්ථ සංකෝකෝචන අවස්ථා කීපයක් මෙහි දී සාකච්ඡා කෙරේ.

- නොඉටූ නොවිකැපූ අයල් සිවුරු දස දවසක් ඉකුම්වා නම් නිසැගි වේ(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 3).

සිඛවලඳට අනුව 'අයල් සිවුරු' යනු අකාල චීවර යන්න යි. චීවර කාලයෙන් ඔබ්බට ලැබෙන සිවුරු අකාල චීවර ලෙස හැඳින් වේ. චීවර කාලය ලෙස සැලකෙන්නේ කිසියම් හේතුවක් නිසා කඨිනයක් සිදු නොකරන විහාරස්ථානවල වප් මාසයත් කඨිනයක් සිදු කරන විහාරස්ථානවල වප් මාසය හා හේමන්ත ඍතුවට අයත් මාස හතරක කාලයත් ය. ඉතිරි මාස අකාලය යි(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 185). අකාලයේ ලැබුණු සිවුරක් දස දවසකට වඩා තබාගැනීම භික්ෂුවට තහනම් ය. 'යල්' යන වචනය කාල යන වචනයෙන් නිරුක්තිය ලැබූවකි. කාල යනු වාරය යි(සෝරත හිමි, 1999:261). අතීත, වර්තමාන, අනාගත යන තුනෙහි ඉමක් කොනක් නැති එකතුව, සිදුවීම් සඳහා ගතවන්නා වූ තත්පර, අවුරුදු, යුග ආදියෙන් මනින සංකල්පය කාල ලෙස අරුත් ගැන්වෙයි(විජයතුංග, 2015: 523). නූතන ව්‍යවහාරයේ කාල 'කල' ලෙස ද භාවිත වෙයි. එහි නියමිත කාලය, උචිත කාලය යන අදහස ඇත. "කලට වෙලාවට බෙහෙත් ටික ගත්තනම් ඔය ලෙඩේ හොඳ කරගන්න තිබ්බා" වැනි ප්‍රකාශ ව්‍යවහාරයේ ඇත. එහි අර්ථය නියමිත කාලයේ දී බෙහෙත් ගත යුතුව තිබූ බවයි. කල යන්න අකල වූ විට අදහස විරුද්ධ වෙයි. උපසර්ග පදයක් ලෙස 'අ' යෙදීමේ දී අර්ථය විරුද්ධ වෙයි. නිදසුනක් ලෙස බල - අබල, ගුණ - අගුණ. කුසල් - අකුසල් ආදිය සැලකිය හැකි ය. යල් යන්නේ ද අර්ථය වාරය නැතහොත් කාලය යි(සෝරත හිමි, 1999: 812). යල් යන්නට 'අ' උපසර්ගය එක් කොට අයල් යන වචනය අවාරය, අවේලාව, අකාලය යන අරුතින් සිඛවලදෙහි සඳහන් කර තිබේ. නූතන ව්‍යවහාරයට අනුව අයල් යන්නෙහි අර්ථය අකාලය යන්නෙන් බැහැර වී අර්ථය සංකෝචනය වී පිටත හා අරමුණක් නොමැතිව යාම යන අර්ථ ගැන් වෙයි. මූල වචනයේ අර්ථය අනුව අකාල යන්න ද එහි අන්තර්ගත වන බවක් පරීක්ෂණාක්ෂිය විශද කිරීමේ දී පෙනෙයි. "කොල්ලා දැන් අයාලේ යනවා වැඩියි." මෙම ප්‍රකාශයට අනුව අයාලේ යාම අරමුණක් රහිත ව ගමන් කිරීම යි. ඒ අනුව සිඛවලදෙහි අර්ථය සංකෝචනය වී නූතනයේ අයල් අයාල බවට පත් වී තිබේ.

- මහණසම්මුති නැතියා වැ නො කල්හි සිවුරු නමින් ඉටු තුන් සිවුරෙන් **úfhda** වැ එක අරුණකුදු ඉකුත්වා නම් නිසගි වේ(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 ፡ 3).

සිඛවලඳට අනුව "වියෝ වැ" යන්නෙහි අර්ථය ඉවත්වීම හෙවත් වියුක්ත වීම යි(සෝරත හිමි, 1999: 954). එකඟත්වයක් නොමැතිව තුන් සිවුරෙන් ඉවත් වී එක උදෑසනක් හෝ සිටීම භික්ෂුවට තහනම් ය. 'යෝ' යන්නෙහි අර්ථය එක්වීම යි(විජයතුංග, 2015:1449). නිශේධාර්ථ 'ú' උපසර්ගය එකතු වූ පසු 'úfhda' යන්නෙහි අර්ථය වෙන් වීම යි. වියෝ යන්නෙන් වියොග, වියොව්, වියොවග, වියෝවමු, වියෝගි වැනි වචන බිහි වී තිබේ. ඒ සියල්ලෙහි අර්ථය වෙන්වීම යි. ව්‍යවහාර සිංහලයේ වියෝ ලෙස වහරන්නේ මිය යාම අර්ථවත් කිරීමට යි. නිදසුනක් ලෙස "ඔහුගේ වියෝව ඇයට දරාගැනීමට නොහැකි විය." "ඇගේ වියෝව මට දුකකි." "පුතාගේ වියෝව දරා ගත නොහැකි වූ මවක් සියදිවි හානි කර ගනියි." උක්ත ප්‍රකාශද්වයේම අර්ථය ඔහුගේ හා ඇයගේ මරණය යි. සිඛවලඳට අනුව භික්ෂුව වියෝ වන්නේ චීවරයෙන් ය. එනම් පුද්ගලයා වස්තුවකින් ඉවත් වූ බව අදහස් වෙයි. වර්තමානයේ පුද්ගලයා කිසියම් වස්තුවකින් ඉවත් වීමට වියෝ යන්න භාවිත නොකරයි. උක්ත සිඛවලඳ පාඨය නූතන ව්‍යවහාරයට අනුව "සිවුර නැතුව ඉන්නවා" යැයි ප්‍රකාශ කෙරෙයි. එනයින් සිඛවලඳට අනුව ඉවත්වීම යන අරුත ඇති 'úfhda' යන්න නූතන ව්‍යවහාර සිංහලයේ මියයාම හඟවන බව පෙනෙයි.

- **පණුවන්** ඇති දිය බැව් දැනැ දැනැ පරිභොග කෙරේ නම් පචිති වෙ(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 ፡ 5).

ප්‍රාණීන් සහිත බව දැන දැන ම එම ජලය පරිභෝජනය කිරීම භික්ෂුවට අනුචිත ය. සංස්කෘත භාෂාවේ ප්‍රාණ යන වචනයෙන් පණු යන වචනය සිංහලයට තත්භව වී ඇත. ඒ අනුව සිඛවලඳෙහි අදහසට අනුව පණුවන් ලෙස සැලකෙන්නේ ප්‍රාණය සහිත කුඩා සතුන් ය(සෝරත හිමි, 1999: 954). ජලයේ ජීවත් වන ඕනෑම කුඩා සතුන් පණුවන් ලෙස සිඛවලඳ කතුවරයා අදහස් කර ඇත. එහෙත් නූතන ව්‍යවහාර සිංහලයේ පණුවන් ලෙස සැලකෙන්නේ කොඳු ඇටය හෝ අත් පා හෝ නැති බඩ ගාමින් ඇදී යන ගැඩවිලා වැනි ඕනෑම කුඩා සතෙකුට යි(විජයතුංග, 2015:1037). පට පණු, කොකු පණු, කිරි පණු ආදි වශයෙන් පණුවන් රාශියකි. ඒ සියලු පණුවෝ ජලයේ වාසය නොකරති. එනයින් සිඛවලඳෙහි ජලයේ හා ගොඩබිම වෙසෙන කුඩා සතුන් ලෙස පුළුල් අර්ථයක් තිබූ පණුවන් යන්නෙහි අර්ථය සංකෝචනය වී අප්‍රසන්න කුඩා ප්‍රාණියෙකු වන පණු විශේෂය හැඳින්වීම සඳහා නූතන ව්‍යවහාරයේ 'පණු' වචනය යෙදෙයි.

- මෙවුන්රායෙන් මිනිස්මාගම කෙරේ මාගම යන සඤ් ඇතියා වැ තමහට මෙවුන්ධමින් **මෙහෙ කිරීමෙහි** ගුණ කියා නම් ඈ එවිගස දත සඟවෙසෙස් වෙ. මෙ හැම අත්තකාමපාරිචරියා සඟවෙසෙස් නම්(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 ፡ 2).

උක්ත පාඨයේ මෙවුන්ධමින් මෙහෙ කිරීම ලෙසින් අර්ථ ගන්වා ඇත්තේ මෛථුන ක්‍රියාවලියෙන් සේවය කිරීමයි. සරලව පවසන්නේ නම් ලිංගිකව එක්වීමයි. මෙවුන්ධම යනු

මෛථුන ධර්ම යන සංස්කෘත වචනයෙන් තත්භව වූ වදනකි. 'මෙහෙ' යන්නෙහි කාර්ය, කටයුත්ත, කර්මාන්තය, වතාවත, උපස්ථානය යන අරුත ඇත(සෝරත හිමි, 1999: 796). නූතන ව්‍යවහාර සිංහලයේ මෙහෙ කිරීම ලෙස හැඳින්වෙන්නේ සේවය කිරීමයි. මෙහෙ කරන්නේ මෙහෙකරු ය. එනම් සේවය කරන්නා යන අදහස මෙහෙකරු යන්නෙහි අරුත් ගැන්වෙයි. නූතන ව්‍යවහාරයේ මෙහෙකරු ලෙස බොහෝ දුරට භාවිත කරන්නේ නිවසක හෝ ආයතනයක සේවය කරන්නන් ය. මැදපෙරදිග ගෘහසේවයට යන කාන්තාවන් වර්තමානයේ හඳුන්වන්නේ මෙහෙකාරියන් ලෙසට ය. ඇතැම් අවස්ථාවල වැඩකරු, වැඩකාරි යනුවෙන් භාෂණයේදී භාවිත වෙයි. තව ද නූතන ව්‍යවහාරයේ කිසියම් සේවයක් නැතහොත් කාර්යයක් යන අරුතින් මෙහෙය යන්න ව්‍යවහාර වෙයි. නිදසුනක් ලෙස "විදුහල්පතිතුමා සිය මෙහෙය අකුරටම සිදු කළේය." යන වාක්‍ය ගත් කල්හි එහි අර්ථය තමාට අයත් රාජකාරිය යි. එසේ ම මෙහෙය හෝ මෙහෙ කිරීම සිඛවලදෙහි සඳහන් අර්ථයෙන් නූතනයේ ව්‍යවහාර නොවෙයි. ලිංගිකව එක්වීම සංවාසය ලෙස හැඳින්වෙයි. එනයින් මෙහෙ කිරීම අතීතයේ සියලු ආකාරයෙන් සේවය කිරීම යන අර්ථයෙන් භාවිත වූ අතර නූතනයේ එම අර්ථය සංකෝචනය වී ඇති බව පෙනෙයි.

- පාදුකායෙන් බැහැරැ සිටැ සිවුරු **නඟා නම්, බහා නම්** (සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970: 7).

උක්ත සිඛවලඳ පාඨයට අනුව සිවුරු නඟා නම් බහා නම් ලෙස හැඳින්වෙන්නේ සිවුරු පෙරවීම හා සිවුරෙන් බැහැර වීම යි. නැඟි යන්නෙහි අර්ථය උස් වූ, එසවුණු යනු යි(සෝරත හිමි, 1999: 502). බහා යන්නෙන් පහතට හෙළා, බස්වා යන අර්ථය දෙයි(සෝරත හිමි, 1999: 681). සිවුර පෙරවීමේදී එය ඒක අංශ හෝ ද්වි අංශ ව උරපතු තෙක් එසවීමක් සිදු වේ. සිවුර ඉවත් කිරීමේ දී උරපත්තේ සිට පහළට හෙළීමක් සිදු වේ. එහෙයින් සිවුරු නැඟීම හා බැසීම යයි සිඛවලඳ කතුවරයා සඳහන් කරයි. එහෙත් වර්තමානයේ සිවුරු නැඟීම හෝ බැසීම ලෙස ව්‍යවහාර නොකරයි. ඒ සඳහා සිවුරු පෙරවීම යන්න භාවිත කෙරේ. නූතන වහරේ නැඟ හෙවත් නඟිනවා ලෙස අරුත් ගැන්වෙන්නේ යමක ඉහළට යාම, එසවීම, වර්ධනය වීම යන අදහස ලබා දීමට යි. සංස්කෘත භාෂාවෙන් ද නග ලෙස හැඳින්වෙන්නේ කන්ද යන්න යි. එහෙයින් උස යන අර්ථය එහි ගැබ් වී ඇති බව සිතිය හැක. "ඔහු ගස් නඟිනවා" "ඔය ගමනේදී කන්දක් නඟින්න සිදු වෙනවා" වැනි ප්‍රකාශ නූතනයේ ව්‍යවහාර වෙයි. එහි අර්ථය ඉහළට යාම යි. වර්තමාන කටවහරේ වර්ධනය වීම, වැඩි වීම යන අර්ථය ද නඟ යන්නෙහි අන්තර්ගත වෙයි. නිදසුනක් ලෙස "ඔය නම කියන්න එපා, මිනිහට යකා නඟියි", "මගේ යකා නග්ගගන්න එපා" වැනි ප්‍රකාශ ගත හැකි ය. යමෙකුගේ කේන්තිය වැඩි වීම යකා නඟිනවා ලෙස වැහැරෙයි. බහා යන්න පහළට ඒම අරුත් ගැන්වෙයි. "පල්ලෙහාට බැහැපන්", "බිමට බස්සන්න" වැනි ප්‍රකාශ අනුව ඒ බව පසක් වෙයි. කෙසේ නමුත් සිවුරු පෙරවීම යන අර්ථය සහිතව භාවිත කළ නැඟීම, බැසීම යන වචනද්වය එම අරුතින් මිදී වර්තමානයේ ඉහළට එසවීම හෝ නැඟීමට හා පහළට පැමිණීම හෝ ගෙන ඒම යන අරුතට සංකෝචනය වී භාවිත වෙයි.

- නොඉටූ නොවිකැපූ පමණින් යුත් පා දස දවසක් ඉකුම්වා නම් නිසැගි වෙ(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 3).

- උනු පස්බාන් ඇතියා වැ අනික් පයක් විනවා ගනී නම් නිසැගි වේ(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 3).

කැප නොවුණු පාත්‍ර දින දහයක් ඉකුත්වා තමා සන්තකයේ තබා ගැනීම භික්ෂුවට අනුචිත ය. මෙහි පා යන්නෙන් අරුත් ගැන්වෙන්නේ පාත්‍ර යන්නයි. පා යන්නෙහි ඒක වචනය පය යි. ඊට අමතරව පය යන්න පාදය, පූජ්‍ය, ජලය වැනි අරුත් නංව යි(සෝරත හිමි, 1999: 556). කට වහරේ ද පය ලෙස අරුත් ගැන්වෙන්නේ කකුලේ පහත කෙළවරට ය. "පය බරවායට පිටි කර බෙහෙත් බඳින්නා වාගේ" වැනි ප්‍රස්ථාව පිරුළු ජන වහරේ වෙයි. බරවා හැදෙන්නේ කකුලට ය. එහෙයින් නූතන වහරේ පය ලෙස පාදය හෙවත් කකුල් අරුත් ගැන්වෙයි. පාත්‍රය යන අරුතින් නූතන වහරේ පා හෝ පය යන්න භාවිත නොකෙරේ. කකුල් යන අර්ථය සහිත පාද යන වචනය පාලි හා සංස්කෘත භාෂාවේ 'පාද' යන වචනයෙන් තත්සම වූවකි. ක්‍රමයෙන් පාද යන්න පා ලෙස විකාසය වී ඇත. උක්ත සිඛවලඳ පාඨයේ 'අනික් පයක්' යන්න නූතන වහරට පැමිණීමේ දී අනිත් කකුල යන අර්ථය ලබා දෙයි. ඊට හේතුව පුරාතන අවධියේ පා ලෙස පාත්‍රය යන්න හැඳින්වුව ද නූතන කටවහරට අනුව එහි අර්ථය පාත්‍රය යන්නෙන් ඉවත් ව පාද හැඳින්වීම සඳහා පමණක් අර්ථ සංකෝචනය වීම යි. මෙය අර්ථ සංකෝචන වීමට හේතුව නම් පුරාතනයේ ද පා හා පය යන්නෙහි පාද යන අර්ථයෙන් ද භාවිත වීම යි. මීට අමතරව නුමුසු හෙළ බසේ පා යන්නෙන් ප්‍රාසාද යන අරුත ද තිබී ඇත. නිදසුනක් ලෙස පහත සියබස්ලකර පාඨය සඳහන් කිරීම උචිත ය.

"කලාගුරු සුලු පා
වැසි වූ කුළුණු නුවණ යුත්
කලණ මිතෙ වියතුන්
ගත්හි පියුම් ලකුණු ඇ"

මෙහි කලාගුරු සුලු පා ලෙස හැඳින්වූයේ කලාගුරු නම් මූල ප්‍රසාද යන්න යි(සියබස්ලකර දීපනී, ගුණවර්ධන, 2003: 91). ලෝවාමහාපාය ද ප්‍රසාදයක් බැවින් පය ලෙස හැඳින්වේ. නමුත් එයද නූතනයේ ඒ අදහසින් භාවිත නොවෙයි.

- ඇදුරුවත්, තෙරවත්, ආගන්තුකවත්, ගමිකවත්, සෙනසුන්වත්, ගිලන්වත් පිරි යැ යුත්තේ යි (සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 12)

උක්ත පාඨයේ ඇදුරුවත් ලෙස සඳහන් කර ඇත්තේ ආචාර්ය වෘත යන්න යි. මෙහි ඇදුරු යන්නෙහි අර්ථය අචාර්යවරයා යන්න යි(සෝරත හිමි, 1999: 146). ආචාර්ය යන පදය සංස්කෘත භාෂාවෙන් තත්සම වූවකි. ආචාර්ය යන්නෙහි තද්භවය ඇදුරා වේ. සම්භාව්‍ය

සිංහලයේ ඇදුරු ලෙස ගුරුවරයා සඳහන් කර තිබේ. නිදසුනක් ලෙස කෝට්ටේ අවධියේ දී වැත්තෑවේ හිමියන් විසින් රචිත යැයි සැලකෙන ගුත්තිල කාව්‍යයේ පහත සඳහන් පද්‍ය දැක්විය හැකි ය.

"ගුත්තිල ඇදුරු සඳ
වීණා වයන ලෙස ඉඳ
පසෙක පනවන ලද
සුදුසු අස්නෙක ගොසින් උන් සඳ"

උතුම් වූ ගුත්තිල ආචාර්යවරයා යන අදහස ගුත්තිල ඇදුරු සඳ යන්නෙන් අර්ථවත් වේ. නමුත් නූතන ව්‍යවහාර සිංහලයේ ඇදුරා යන්න කට්ටඩියා, මන්ත්‍රකාරයා, තොවිල්කරුවා යන අදහසින් ව්‍යවහාර වෙයි. බොහෝ සෙයින් නූතන ශාන්තිකර්ම හෙවත් තොවිල්වල දී යකැදුරා ලෙස ව්‍යවහාර වන්නේ යක් + ඇදුරා යන්න සන්ධි වීමෙනි. යක්ෂයින් වෙනුවෙන් හෝ යක්ෂයින්ට එරෙහිව මන්ත්‍ර වැඩ කරන මන්ත්‍රාචාර්යවරයා හඳුන්වන්නේ යකැදුරා ලෙස යි. වක්‍රානුකූල ව එහි ද ගුරුවරයා යන්න ගැබ් වී ඇති බව පෙනෙයි. එහෙත් නූතනයේ ඇතැම් අවස්ථාවල දී ගුරුවරයා හැඳින්වීම සඳහා ඇදුරු යන වචනය භාවිත වේ. "සෙනෙහෙබර ඇදුරුතුමනි - වඳිමු ඔබේ පා බැතියෙන්", "ඇදුරු මඬුල්ලේ ගුරු මෑණිවරුන්ගෙන් ද, පියවරුන්ගෙන් ද අවසරයි" ආදි වශයෙන් පාණ්ඩිත්‍ය ප්‍රකට කිරීම උදෙසා ව්‍යවහාර වන අවස්ථා ද වෙයි. එහෙත් අතීතයේ පුළුල් ව භාවිත කළ සියලු ශිල්පයෙහි ගුරුවරයා හැඳින්වීම යන්න සංකෝචනය වී වහරන සිංහලයේ දී ප්‍රධාන වශයෙන් තොවිල් කරන්නා යන අර්ථයෙන් භාවිත වෙයි.

- මෙසෙයින් මහල්ලන් තුන් යලක් කියා පවරන්නේ යි (සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 14)

උක්ත සිඛවලඳ පාඨයට අනුව 'යල' ලෙස සැලකෙන්නේ අවස්ථා යන්නයි. තුන් වාරයක් පැවසීම තුන් යලක් කියා යන්නෙන් අරුත් ගැන්වෙයි. යල යන්නෙහි අර්ථය නැවත යන්න යි(සෝරත හිමි, 1999: 811). අකාලය, අනියම් කාලය, කාලය, වාරය, වේලාව, යල කන්නය යන අර්ථ ද යල යන්නෙහි අරුත් ගැන්වෙයි(විජයතුංග, 2015:1439). තුන් වාරයක් පැවසීම යන්නෙන් නැවත නැවත පැවසීම යන අදහස ගැබ් වී තිබේ. වර්තමානයේ නැවත යන්න යළි ලෙස භාවිත වෙයි. සුමංගල ශබ්දකෝෂයට අනුව යල හා යලි යන වචන්ද්වයේම අදහස නැවත යන්න යි(සෝරත හිමි, 1999: 811). නූතන ලේඛන වහරට අනුව යල යන්න නැවත යන අදහසින් භාවිත කිරීමේ දි යළි ලෙස භාවිත කරයි. දන්තජ ල අක්ෂරය වෙනුවට මූර්ධජ ළ අක්ෂරය බොහෝ දෙනෙක් භාවිත කරයි. නමුත් විකල්පයේ යලි ලෙස දන්තජ ල අක්ෂරය භාවිත වන අවස්ථා ද දක්නට ලැබේ. කෙසේ නමුත් මෙහි දී පෙනී යන්නේ වාරයක් ලෙස පැරණි සිංහලයේ භාවිත වූ යල යන්න නැවත යන අරුතට සංකෝචනය වී යළි ලෙස භාවිත වන බව යි.

## 3. අර්ථ පරිවර්තනය

සමීප සම්බන්ධතාවය, සමානතාව, ආදි සාධක හේතුවෙන් වචනයක අදහස වෙන අදහසක් සමඟ ගැටීමේ ප්‍රතිඵලයක් වශයෙන් අදහස් මාරු වීම හෝ වෙනස් වීම අර්ථ පරිවර්තනය ලෙස හැඳින් වේ. අර්ථ පරිවර්තනයේ දී බොහෝ සෙයින් සිදු වන්නේ පළමුව පවතින අදහසට සමීප අර්ථයක් සහිත ව  භාවිත වීම යි(ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර, 2015: 101). සිඛවලඳ ග්‍රන්ථයේ සඳහන් හඳුනාගත් අර්ථ පරිවර්තන අවස්ථා කිහිපයක් පහත පරිදි විමර්ශනය කළ හැකි ය.

- එහි **කසළ** දුට නොහරී නම්- නොහරවා නම්(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 08)-

සිඛවලඳට අනුව මෙහි කසළ ලෙස සඳහන් කර ඇත්තේ වර්චස් ය. වැසිකිළියෙහි අශූචි තිබෙනු දැක එය පිරිසිදු නොකර සිටීමට භික්ෂුවකට නොහැකි බව මෙහි අර්ථය යි.  කසළ යන්නෙහි වර්චස්, අශූචි යන අර්ථය සහිත බව ද ශබ්දකෝෂ සාක්ෂ්‍ය සපය යි(විජයතුංග, 2015: 494).   කසළ මං ලෙස සැලකෙන්නේ අධෝ මාර්ගය යි(සෝරත හිමි, 1999: 251). සංස්කෘත 'කෂ' යන වචනයෙන් කසළ යන්න තත්සම වී ඇත.  නූතන වහරේ අශූචි හැඳින්වීම සඳහා කසළ යන වචනය භාවිත නොකෙරේ. "නගරයේ කැළි කසළ හැම තැන", "කසළ ප්‍රතිචක්‍රීකරණයට නව වැඩපිළිවෙලක්" වැනි ප්‍රකාශ නූතනයේ ව්‍යවහාර වෙයි. ඉන් අර්ථවත් වන්නේ පොදුවේ අපද්‍රව්‍ය යි. අශූචි ද බැහැර කරන්නකි. අපද්‍රව්‍ය ද බැහැර කරන්න කි. එහෙයින් ඒ වචන්ද්වයේ සමාන සම්බන්ධයක් ඇත. එනයින් කසළ යන්නෙහි තිබූ වර්චස් හෙවත් අශූචි යන අර්ථය පරිවර්තනය වී අපද්‍රව්‍ය යන්නට පමණක් නූතන වහරේ එය භාවිත කරන බැව් පෙනෙයි.

- නොගිලන් වැ **අරමින්** බැහැරැ වහන් ලා යේ නම්(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 08)

උක්ත සිඛවලඳ පාඨයට අනුව අරම ලෙස හැඳින්වූයේ භික්ෂූන් වහන්සේ වැඩ වාසය කළ ආරණ්‍යය යි. ආරණ්‍ය යන වචනයෙන් ආරාමය බිඳී ඇත. අරම යන්නෙහි වනය හෙවත් උද්‍යානය යන අරුත ඇත. අරම, අරඹ ලෙස ද හැඳින්වෙයි. පුවක් අරඹ, තල් අරඹ, අඹ අරම, කෙසල් අරම ආදි වචනවලින් ඒ බව පසක් වෙයි. බුද්ධකාලයේ ආරාම ලෙස වනාන්තර හෝ උද්‍යාන ආශ්‍රිත ව භික්ෂූන් වහන්සේ සඳහා වැඩ වාසය කිරීමට ඉදි කළ ලෙන් හෝ සංඝාවාසය හැඳින්විණි. නිදසුනක් ලෙස බිම්බිසාර රජු බුදුරදුන්ට පූජා කළ වේළුවනාරාමය යනු උණ වනයකි. අනේ පිඬු සිටුතුමා ජේතවනාරාමය ඉදි කරන්නේ ජේතවන උයනේ ය. නූතන වහරේ අරම යන්න ආරාමය ලෙස වහරන්නේ පොදුවේ විහාරස්ථාන හැඳින්වීම සඳහා ය. පුරාණ ශෛලබිම්බාරාමය, සුදර්ශනාරාමය, වික්‍රමාරාමය ආදි වශයෙන් නූතනයේ බොහෝ විහාරස්ථාන වෙයි. එනයින් අරම යන්නෙහි අර්ථය පරිවර්තනය වී ඇති බව පෙනෙයි.

## 4. අර්ථාවනතිය

උසස් අදහසක් හෝ සාමාන්‍ය අදහසක් දීම සඳහා ව්‍යවහාර කළ වචනයක් පසුව පහත් අදහසක් දීම සඳහා යෙදේ නම් එය අර්ථාවනතිය ලෙස හැඳින්වේ(ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර, 2015: 104). සිඛවලදේ එවැනි අවස්ථා කිහිපයක් පහත පරිදි හඳුනාගත හැකි ය.

- පර මිනික්සතක්හු අයත් පල් පොහොනා වතක් සොර සිතින් ගත පරිජි වෙ. මෙ හැම අයිනාදන් පරිජි නම් -(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 01)-

උක්ත පාඨයේ පර මිනික්සතක්හු ලෙස සඳහන් කර ඇත්තේ වෙනත් මිනිසෙක් යන අදහස යි. එනයින් පර යනු වෙනත් යන අර්ථය දෙයි. පර දේශ යනු වෙනත් දේශයයි. පර පණ යනු තමන්ගේ පණ නොව අනුන්ගේ පණ යි. පර පෝෂිත යනු අනුනේගෙන් යැපෙන යන්න යි. එනයින් පර යන්නෙහි අර්ථය වෙනත් හෝ අන්‍යයා හෝ සතුරා යන අර්ථය යි(සෝරත හිමි, 1999: 556). නූතන වහරේ දී පර යන වචනය අර්ථය හීන වී ඇති අයුරු පෙනෙයි. සාමාන්‍ය සමාජයේ කෙනෙකුට බැණීමේ දී මෙම වචනය භාවිත කරන බවක් හඳුනා ගත හැකි ය. "පර බල්ලා, පරයා, පරට්ටි" වශයෙන් ග්‍රාම්‍ය වහරේ දී දෝෂාරෝපණය කරන අයුරු ඇසිය හැක. ඇතැම් ප්‍රදේශවල සාමාන්‍ය වයසේ කොල්ලන් කෙල්ලන් හැඳින්වීම සඳහා පරයා හා පරට්ටි යන වචන භාවිත වේ.

- දියෙහි කෙළී නම් (සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 05)

දියෙහි කෙළී යන්නෙහි අර්ථය නම් ජලයේ ක්‍රීඩා කරන බව යි. කෙළිනවා යනු ක්‍රීඩා කිරීම, විහිලුව යන්න යි(සෝරත හිමි, 1999: 295). එසේ ම විනෝදය හා ප්‍රීතිය ගෙන දෙන ක්‍රියාව, සෙල්ලම, රඟුම, රති ක්‍රීඩාව, වද හිංසාව යන අරුත් ද ගැබ් වී තිබේ(විජයතුංග, 2015:589). කෙළි යන්න පාලි හා ප්‍රාකෘත භාෂාවේ ක්‍රීඩාව යන අර්ථය සහිත 'කිල' යන්නෙන් තත්භව වූවකි. සම්භාව්‍ය සාහිත්‍යයේ දිය කෙළිය, රති කෙළිය ලෙස ක්‍රීඩා කිරීම අර්ථයෙන් යෙදෙන අවස්ථා හමු වෙයි. එහෙත් නූතන වහරේ කෙළිනවා යන්න අප වචනයක් ලෙස භාවිත කරයි. බොහෝ අවස්ථා වලදී ග්‍රාම්‍ය වහරේ දී ලිංගිකව එක්වීම අර්ථවත් කිරීම සඳහා කෙළිනවා යන්න භාවිත කරයි. ඊට අමතර ව මිතුරු භාෂණයේ දි යමක් ඉවර වූ බව හෝ විනාශ වූ බව නැතහොත් හානියක් වූ බව ප්‍රකාශ කිරීම සඳහා භාවිත වේ. " කෙළියා තාප්පෙට, සිරිපාලයට අලියා කෙළලා, අලි කෙළියක්නේ යකෝ මේක, අද නම් කෙළවෙන්නයි යන්නේ" ආදි වශයෙන් ප්‍රකාශ කරන අවස්ථා හමු වෙයි. එය අද වන විට අවිචාරවත් වචනයක් ලෙස පිළිගැනෙන බවක් පෙනෙයි.

- **මල්පක්** ආදීන් කුලන් සගන්නා සඳහා දේ නම් දුකුළා වේ(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 : 09)
- හැම රුවනුදු හැම ධඤ්ඤයිදු මාගම් සැටි රුදු මාගම් පලඳනාදු අවුස් බඞුදු ගස්හි තුබු කෑ යුතු **පකාපැකිදු** පුබ්බණ්ණ අපරණ්ණයිදු පිරිමදී නම් දුකුළා වෙ.

මල්පක් යනු මල් හා ගෙඩි ය. පකා පැකි යනු ලොකු ගෙඩි හා කුඩා ගෙඩි ය(සෝරත හිමි, 1999: 589). පාලි භාෂාවෙන් 'පක්ඛ' යන්න සිංහලයට පක ලෙස තත්භව වී ඇත. පක ඒකවචන වන අතර පක් යනු එහි බහු වචනය යි. අමුවෙන් ආහාරයට ගත හැකි ගෙඩි වර්ග නැතහොත් පලතුරු හැඳින්වීම සඳහා පක් ලෙස භාවිත වී තිබේ. එහෙත් නූතනයේ දී එම වචනය සිංහලයේ අප භාෂා වචනයක් ලෙස භාවිත වෙයි.

- ඇත් අස් වලස් තරස් සිහ වග දිවි බලු දික්දැ මසුදු මෙතෙක් දෙනාගේ ඇටදුසමුදු ලේදු බික්සන්ගුන් අවක්සා මැරූ මසුදු නුපුළුවුත්මසුදු වැළඳුව දුකුළා වෙ(සිබවලඳ හා සිබවලඳ විනිස, 1970 : 07)-

උක්ත පාඨයේ බලු ලෙස බල්ලන් හඳුන්වා ඇත. සංස්කෘත භාෂාවේ 'හල්ලු' යන වචනයෙන් බල්ලා යන්න තද්භව වී තිබේ. බල්ලා ගෘහාශ්‍රිත ව වෙසෙන සුරතල් සතෙක් ය. එහෙත් නූතන වහරේ බල්ලා අවිචාරවත් භාෂා හැසිරීමේදී ජනප්‍රිය ව භාවිත වේ. " බලු වැඩ කරන්න එපා", "උඹ නම් මහා බල්ලෙක්", මේවා බල්ලොවත් කන්නේ නෑ", "බල්ලෙක්ට සැලකුවා නම් උං නැට්ට හරි වනනවා" වැනි ප්‍රකාශ අධ්‍යයනයේ දී පෙනී යන්නේ බල්ලා සමාජයේ පහත් ම නීච ම ස්ථානයට භාෂකයින් විසින් හෙළා ඇති බව යි. විද්වත් සාකච්ඡාවක දී මෙන් ම ශාස්ත්‍රීය ලේඛනවල දී බල්ලා ලෙස භාවිත කිරීම වෙනුවට සුනඛයා ලෙස භාවිත කිරීමට ඇතැමුන් පෙලඹෙන්නේ බල්ලා යන්නෙහි විදග්ධ නොවීම හා සුනඛයා යන්නෙහි විදග්ධභාවයක් නැතහොත් ශික්ෂණයක් සහිත යයි භාෂා පරිණාමයත් සමග භාෂා සමාජය තුළ එල්බුණු භාෂා මතවාදයක් හේතුවෙනි.

## 5. අර්ථෝන්නතිය හෙවත් අදහස උසස් වීම

වචනයක අදහස මුලින් තිබූ තත්වයට වඩා උසස් ලෙස හෝ උත්කර්ෂවත් ලෙස භාවිත වන්නේ නම් එය අර්ථෝන්නතිය ලෙස සැලකේ(ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර, 2015: 103). එහි ප්‍රධාන ප්‍රභේද කිහිපයක් දක්නට ලැබේ. ධනාත්මක අර්ථෝන්නතිය (Positive Connotation), සුභාෂිත අර්ථෝන්නතිය (Euphemistic Amelioration), සංස්කෘතික පරිණාමය (Cultural Elevation), බුද්ධිමය හෝ ශාස්ත්‍රීය දියුණුව සමග අර්තොන්නතිය වීම (Intellectual or Scholarly Amelioration), වෘත්තීය හා තාක්ෂණය හේතුවෙන් අර්ථෝන්නතිය වීම (Professional or Technical Amelioration), ළෙන්ගතුවීම හා හැඟීම්බර වීම හේතුවෙන් අර්ථෝන්නතිය සිදු වීම (Affectionate or Diminutive Amelioration) යනු ඒවා යි(Gleason, 1961) සිබවලදේ එවැනි අවස්ථා කිහිපයක් මෙහි දී සාකච්ඡාවට ගැනෙයි.

ඇත් අස් වලස් තරස් **සිහ** වග දිවි **බලු** දික්දැ මසුදු මෙතෙක් දෙනාගේ ඇටදුසමුදු ලේදු බික්සන්ගුන් අවක්සා මැරූ මසුදු නුපුළුවුත්මසුදු වැළඳුව දුකුළා වෙ(සිබවලඳ හා සිබවලඳ විනිස, 1970 : 07)-

උක්ත පාඨයේ බලු යන වචනය අර්ථාවනතියට පත් වී ඇති අයුරු පූර්වයෙන් සාකච්ඡා කර ඇත. මෙහි දී එහි අර්ථෝන්නතියට ලක් වී ඇති ආකාරය සාකච්ඡා කෙරේ.

ග්ලේසන්ගේ විග්‍රහයට අනුව ළෙන්ගතුවීම හා හැඟීම්බර වීම හේතුවෙන් අර්ථෝන්නතිය වන බව පැහැදිලි ය. කෙනෙකුට ආදරය ප්‍රකාශ කිරීමේ දී මෙන් ම පොඩි දරුවෙකු සුරතල් කිරීමේ දී බලු ලෙස භාවිත කරන ආකාරයක් හඳුනා ගත හැකි ය. "මගේ චූටි බලු පැටියා, මගේ බලු කුක්කා, බච්චා පැටියා" ආදි වශයෙන් ආදරය කිරීමේ දී ආමන්ත්‍රණය කෙරේ.

සිංහ යනු සංස්කෘත හා පාලි භාෂාද්වයෙන් සිංහලයට තත්සම වූ වචනයකි. මෙහි සිංහ ලෙස සිංහයා හැඳින්වුව ද නූතන භාෂණයේ දී සිංහයා නම් සත්වයා යන අර්ථයෙන් මිදී නිර්භීත ප්‍රතාපවත් යන අරුතින් වැහැරෙයි. විශේෂයෙන් ම එයට හේතුව වී ඇත්තේ සිංහයා වනයේ වෙසෙන නිර්භීත ම සතා ලෙස පිළිගැනෙන සාමාන්‍ය නියමය හේතුවෙනි. "ඕකා සිංහයෙක් වගේ මිනිහා" වැනි ප්‍රකාශයක් ගත විට එහි එම පුද්ගලයාව මිනිසා යන්නටත් වඩා උසස් කොට දැඩි තේජාන්විත බවක් ආරෝපණය කර ඇත. එසේ ම පෙළපත් නාමයන් හා ඇතැම් පුද්ගලයන් හැඳින්වීම සඳහා "සිංහ" ලෙස භාවිත කරන්නේ තමාගේ බලය, ශක්තිය පෙන්වීමටය. රාජසිංහ, විජයසිංහ, ගරුසිංහ, ප්‍රතාපසිංහ, ජයසිංහ, වික්‍රමසිංහ එවැනි පුද්ගල නාම කිහිපයකි. සිංහ නිෂ්පාදන, සිංහ සමාජය, සිංහ කාර්මිකයෝ ආදි වශයෙන් විවිධ සමාජ කණ්ඩායම් හා ආයතන හැඳින්වීම සඳහා භාවිත කරන බව නූතනයේ දැකිය හැකි ය. එනයින් එහි අර්ථය පවතින අර්ථයට වඩා නූතන ව්‍යවහාර සිංහලයේ අර්ථය තීව්‍ර වී භාවිත වේ.

## 6. අර්ථ විරෝධය

කලින් තිබූ අදහසට හාත්පසින් ම විරුද්ධ අදහසක් දෙන වචන භාවිත වේ නම් ඒ අර්ථ විරෝධය වීම නිසාය(ආනන්ද ජයසේකර සහ චිත්‍රා ජයසේකර, 2015፡ 105).

- මවුකුස්හි පටා මිනිස්සතක්හු මැරියැටි සිතින් දිවි ගැළැවුව පරිජි වෙ. මේ හැම මිනිස්විකා පරිජි නම්(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 ፡ 01).

මෙහි දිවි ගැලවුව ලෙස හැඳින්වෙන්නේ ප්‍රාණය නිරුද්ධ කිරීම යි. සරලව ම පැවසතොත් ප්‍රාණ ඝාතය යි. දිවි යනු ජීවිතය යි. ගැලවීම යනු ගිලිහීම යි(සෝරත හිමි, 1999፡ 329). එනයින් ජීවිතයෙන් ගිලිහීම මෙහි දිවි ගැලවුම ලෙස අරුත් ගැන්වෙයි. නමුදු නූතන වහෙරේ දිවි ගැලවුම ලෙස අර්ථවත් වන්නේ එහි මුල් අර්ථයේ විරුද්ධත්වය යි. යමෙකුගේ ජීවිතය බේරා ගැනීම දිවි ගැලවුම නම් වේ. "සිරිපාලට අලියා ගහලා දිවි ගැලවුනේ අනූනමයෙන්." මෙම පාඨය සැලකිල්ලට ගැනීමේ දී ඉන් විද්‍යමාන වෙන්නේ සිරිපාල වන අලි ප්‍රහාරයට ලක් වුව ද ඔහු කෙසේ හෝ සිය දිවි රැක ගත් බව යි. එනයින් දිවි ගැලවුව යන්නෙහි අර්ථ විරෝධය වී ඇති බව පෙනෙයි.

## 7. අර්ථ හානිය

අර්ථ හානිය ලෙස සඳහන් කෙරෙන්නේ වචනයක තුබූ අදහස පිරිහී යාම හෝ සම්පූර්ණයෙන් ම හානි වී අර්ථ ශූන්‍ය තත්වයට පත් වීම යි(ආනන්ද ජයසේකර සහ චිත්‍රා

ජයසේකර, 2015: 103). එවැනි වචන ගණනාවක් සිබවලඳෙහි දැකිය හැකි ය. සිබවලඳට අනුව පරිහානියට පත් වී ඇත්තේ සිංහලයෙහි නිෂ්පන්න වචන යි. භාෂා සංස්පර්ශය, සෘණීකරණය වැනි හේතූන් නිසා හෙළ නිපන් වදන්වල අර්ථ හානිය වී ඇත.

- පර මිනික්සතක්හු අයත් **පල් පොහොනා** වතක් සොර සිතින් ගත පරිජි වෙ. මෙ හැම අයිනාදන් පරිජි නම් -(සිබවලඳ හා සිබවලඳ විනිස, 1970: 01)

මෙහි පල් පොහොනා ලෙස සැලකෙන්නේ කහවණුවෙන් හතරෙන් කොටස හෙවත් ශත හැත්තෑ පහක ප්‍රමාණය යි. පාදයක් අගනා කවර දෙයක වුවත් හතරෙන් කොටස පාදය නම් වේ. පාද පල වී ද, පල පල් වී ඇති බව ද මතය යි(සිබවලඳ හා සිබවලඳ විනිස, 1970: 227). එහෙත් වර්තමානයේ මෙම වචනය භාවිත නොකෙරෙයි. ශ්‍රී ලංකාවේ මුදල් ඒකකය රුපියල් ය. සාමාන්‍ය ගනුදෙනු රුපියල්වලින් සිදු කෙරෙන නිසා ශත ගණන්වලින් ගණන් සැකසුව ද ශත වර්තමානයේ භාවිත නොවේ. එහෙයින් පල්පොහොනා යන්න වර්තමානයේ භාවිත නොකෙරේ. එසේම පොහොනා යන්නෙහි බෙදා දෙන, සෑහෙන, ප්‍රමාණ වන, වටිනා, අගනා, යෝග්‍ය, සුදුසු යන අර්ථ ඇත(සෝරත හිමි, 1999: 649). එහෙත් ඒ කිසිදු අරුතකින් පොහොනා යන්න වර්තමානයේ ව්‍යවහාර සිංහලයේ භාවිත නොකෙරේ.

- සුකුරු මිදියැටි සිතින් සිහිනෙන් විනා අද ඇති බැහැරි වත්හි තමා **හදන්** සටා සුකුරු මිඳුව සඟවෙසෙස් වේ. මේ හැම සුක්වියැටි සඟවෙසෙස් නම් (සිබවලඳ හා සිබවලඳ විනිස, 1970 : 01).

ශුක්‍රාණු මිදීමේ අදහසින් සිහියෙන් යුක්ත ව අභ්‍යන්තරයෙහි හෝ බාහිර වස්තුවක ස්වකීය පුරුෂ ලිංගය ඝට්ටනය කොට ශුක්‍රාණු මුදා හැරීම භික්ෂුවට අනුචිත ය. ඒ අනුව මෙහි හදන් ලෙස හඳුන්වන්නේ පුරුෂ ලිංගය යි(සෝරත හිමි, 1999: 1146). ලිංග යනු සංස්කෘත භාෂාවේ හා පාලි භාෂාවේ ලිංග වචනයෙන් සිංහලයට තත්සම වූව කි. විශේෂයෙන් මෙය පුරුෂ ලිංගය හැඳින්වීමට භාවිත කරන්නට ඇත්තේ අනුරාධපුර රාජධානි සමයේ දී භාරතීය ආක්‍රමණ හේතුවෙන් හින්දු සමය ප්‍රචලිත වීමත් සමග ඇති වූ ශිව ලිංග වන්දනාව සමග යැයි සිතිය හැකි ය. පුරුෂයන් සතු ශිෂ්ණය හැඳින්වීම සඳහා වර්තමානයේ පුරුෂ ලිංගය යන වචනය යොදා ගැනේ. ලිංග යනු පොදු ලිංග නාම පදයකි. පුරුෂ ලිංගය හා ස්ත්‍රී ලිංගය යන වචනවලින් පොදුවේ මිනිසුන් සතු ලිංගික අවයව නම් කරයි. වර්තමානයේ ද පුරුෂ ලිංගය හැඳින්වීම සඳහා ශිෂ්ට සම්පන්න යැයි සිතන වචනයක් ලෙස පොදුවේ භාවිත කරන්නේ ශිෂ්ණය යි. ශිෂ්ණ යනු ද සංස්කෘත භාෂාවෙන් තත්සම වූ වචනය කි. හදන් යනු සිංහලයේ නිෂ්පන්න වචනයකි. එකී වචනය භාවිතයෙන් මිදී ඇති අතර අද බොහෝ දුරට පුරුෂ ලිංගය හැඳින්වීම සඳහා භාවිත කරන්නේ අප භාෂාත්මක යෙදුම් ය. එනයින් හදන් යන්නෙහි අර්ථය නූතනය වන විට හානි වී ඇති බව පසක් වෙයි.

- ගිරිති කවා නම් පචිති වෙ(සිබවලඳ හා සිබවලඳ විනිස, 1970: 05).

ගිරිති යනු කිතිය යි. කරදරය යන්නද එහි ගැබ් වී ඇත(සෝරත හිමි, 1999: 337). ගිරිති කවනවා යනු කිති කැවීම යි. එය බුත්සරණේ විරිති ලෙස ද දැක් වේ. කිති ද සිංහලයෙහි

නිපන් වචනයකි. වර්තමාන ව්‍යවහාර සිංහලයේ කිති කවනවා යන්න කිචි කවනවා ලෙස ද වැහැරෙයි. කිසියම් කෙනෙක් ලැජ්ජාවෙන් පසු වන අවස්ථාවල දී "මේකගේ කිචිය" "උඹට කිචි ද" ආදි වශයෙන් භාවිත වන අවස්ථා දැක ගත හැකි ය. නූතන ව්‍යවහාර සිංහලයේ ගිරිති කැවීම යන වචනය භාවිත නොවේ.

- සුළුදියවටන්හිදු පියෙව්ගෙහිදු උකැසි නො පැහැරැ වදී නම් දුබැසි වෙ(සිඛවලඳ හා සිඛවලඳ විනිස, 1970 ඃ 07)

සුළුදියවටන් යනු මූත්‍ර කෘත්‍යය කරන ස්ථානය යි(සෝරත හිමි, 1999ඃ 1112). සුළුදිය යනු මූත්‍ර යි. සුළුදිය යන වචනය වර්තමානයේ සම්පූර්ණයෙන් හානියට ලක් වූ වචනයක් නොවෙයි. එය ක්‍රමයෙන් පරිහානියට පත් වන වචනයකි. සංස්කෘත භාෂාවේ මූත්‍ර යන වචනය තත්සම වී මූත්‍ර යන්න භාවිත වේ. මූත්‍ර යන්න නිවැරදි වචනය වුව ද ව්‍යවහාරයේ දී කථනයේ පහසුව තකා මුත්‍රා ලෙස භාවිත කරන නමුත් ලේඛනයේ දී එය සාවද්‍ය යි. සුළුදිය පහ කිරීම, සුළුදිය බර, සුළු දිය දැමීම වශයෙන් නූතනයේ ඇතැමුන් මෙය භාවිත කරන බවක් ද පෙනෙයි.

මීට අමතර ව අර්ථ හානියට ලක් වූ වචන සමූහයක් ම සිඛවලඳෙන් හමු වේ. පුප් වළ යනු වැසිකිළි වළ යි. පුසන් යනු අශුචි පිසදමන ලී කොටුව යි. පුසන් කිස සාහා නම් ලෙස හැඳින්වෙන්නේ මළ පිස දැමීම යි. වස් දෙණිය යනු කැසිකිළියෙහි මූත්‍ර කිරීම සඳහා සාදා ඇති ඔරුව යි. ලිහිණිවැ යනු නග්න ව සිටීම හෙවත් නිර්වස්ත්‍ර ව සිටීම යි. උභතො බ්‍යඤ්ජනකයා යනු ඒ ඒ අවස්ථාවෙහි ස්ත්‍රී පුරුෂ අදහස් දෙකම ඇති වන්නාට ය. මේ වචන කිසිවක් නූතන වහරේ දී භාවිතයට නොගෙනෙ යි. තාක්ෂණයේ දියුණුවත් සමග හා සමාජීය සංස්කෘතික දියුණුවත් සමග නැසිකිළි භාවිතයේ දී භාවිත කළ වචන බොහොමයක් නූතනයේ අර්ථ හානියට ලක් වී ඇති බව පෙනෙයි.

මෙලෙස සිංහල භාෂාවේ අර්ථ විපර්යාසය සිදු වී ඇති ආකාරය අර්ථ විපර්යාස ක්‍රම හත ඔස්සේ විග්‍රහ කළ හැකි ය.

## නිගමනය

තුලනාත්මක වාග්විද්‍යාවේ වඩා වැදගත් විෂය ක්ෂේත්‍රයක් වන අර්ථ විචාරය (semantics) න්‍යායික ව සංවර්ධනය කළේ මයිකල් බ්‍රියෙල් ය. ඊට පෙර ම සංස්කෘත වෛයාකරණඥයන් හා අපරදිග භාෂාවේදීන් විසින් පදනම සකස් කරනු ලැබ ඇත. බ්‍රියෙල් විසින් අර්ථ විපර්යාස ප්‍රධාන ක්‍රම හතරක් ඉදිරිපත් කර ඇති අතර බ්ලූම්ෆීල්ඩ් ප්‍රධාන ක්‍රම පහක් ඉදිරිපත් කර තිබේ. බ්‍රියෙල්ගේ මතය ම අනුව යමින් ස්ටෙෆන් උල්මාන් ද අර්ථ විපර්යාසය පිළිබඳ වැදගත් අදහස් ඉදිරිපත් කර තිබේ. සිංහල භාෂාවේ අර්ථ විපර්යාස ක්‍රම හතක් ඇති බව ආනන්ද ජයසේකර හා චිත්‍රා ජයසේකර ඉදිරිපත් කරති. සිංහල ව්‍යාඛ්‍යාන සාහිත්‍යයේ දී අධ්‍යනය කරන අනුරාධපුර සාහිත්‍ය අවදියේ දී නුමුසු හෙළ බසින් රචනා වී

ඇති සිඛවලදෙහි වචන නූතන ව්‍යවහාර සිංහලයේ දී භාවිත වචන සමග තුලනාත්මක ව අධ්‍යනය කිරීමේ දී අර්ථ විපර්යාසයට ලක් වී ඇති අයුරු අධ්‍යයනය කළ හැකි ය. සිඛවලඳ ලියැවුණු තත් අවධියේ සිංහල භාෂාව වඩාත් සංවර්ධිත ව තිබූ බවත් ක්‍රමයෙන් භාෂා සංස්පර්ශය හේතුවෙන් ද විවිධ සමාජීය සාධකවල බලපෑමෙන් ද සිංහලයෙහි නිෂ්පන්න වාග්කෝෂය ක්‍රමයෙන් පරිහානියට පත් වී ඇති බවත් සෙසු භාෂාවන්ගේ බලපෑම හේතුවෙන් සිංහල භාෂාව තත්සම හා තද්භව වාග්කෝෂයෙන් සංවර්ධනය වූ බවත් නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය


කරුණාතිලක, ඩබ්.එස්. (2006). **ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කෝපරහේවා, සඳගෝමි (2020). **සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගමගේ, ජයනි සමීරා (2017). **ව්‍යවහාර සිංහලයේ අර්ථ විපර්යාසය.** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

ගුණවර්ධන, වී.ඩී.එස්. (2003). (සංස්.) **සියබස්ලකර දීපනී.** කොළඹ 10: සමයවර්ධන පොත්හල.

ජයසේකර, ආනන්ද සහ ජයසේකර චිත්‍රා (2015). **තුලනාත්මක වාග්විද්‍යාව.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, ජේ.බී. (2005). **මානව භාෂා ප්‍රවේශය.** කළුබෝවිල: සුමිත ප්‍රකාශකයෝ.

විජයතුංග, හරිශ්චන්ද්‍ර (2015). **ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය.** කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ (1970). (සංස්.) **සිඛවලඳ හා සිඛවලඳ විනිස.** කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

සෝරත හිමි, වැලිවිටියේ (1999). **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (ප්‍රථම භාගය).** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝරත හිමි, වැලිවිටියේ (1999). **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය (ද්විතීය භාගය).** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි, ඩී.ඊ. (1965). (සංස්.) **සිංහල විශ්වකෝෂය, දෙවැනි වෙළුම.** කොළඹ: ලංකා සංස්කෘතික දෙපාර්තමේන්තුව.

*Encyclopedia Britannica* Vol 30 (1911). London: The Encyclopedia Biri' Company.

Gleason, Hugh Allan (1961). *An Introduction to Descreptive Linguistics*. New York: Holt. Rinehart and Winston.

Modrak, Deborah K.W. (2000). *Aristotlezs Theory of Language and Meaning.* Cambridge University Press.

Muller, Norbert (05.11.2015). *Michel Breal (1832 – 1915)- The man behind the idea of the Marathon.* Olympic Studies Centre. https://olympicstudy.org4articles4michel-breal

Thomason, Steven (1993). *Semantic Analysis of the Modal Syllogistic. Journal of philosophical logic.*

Ullmann, Stephen (1957). *The Principles of Semantics.* Oxford: Basil Blackwell.

Ullmann, Stephen (1963). *The image in the word.* Oxford: Basil Blackwell.